# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ජනවාරි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 19.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නිති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත

[සහතිකය සටහන් කළේ: 2008 ජනවාරි මස 23 වන දින]

එල්. ඩී.— ඕ. 62/2003.

ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වී සිටින්නා වූ සහ මාදක ඖෂධ සහ මනෝ වර්තක නිති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානු සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

වියනාහි දී පවත්වන ලද 1988 එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී මත් ද්‍රව්‍ය සහ මනෝ වර්තක නිති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහිව වූ සම්මුතියක් (මෙහි මින් මතු "1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වියනාහි දී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී 1988 දී සම්මත කර ගනු ලැබ, 1988 දෙසැම්බර් මස 20 වන දින වියනාහි දී අත්සන් කරනු ලැබූ හෙයින් ද : පූර්විකාව.

මාලේ නගරයේ පවත්වන ලද කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානු සංගමයේ 5 වන සමුළුවේ දී (මෙහි මින් මතු "සාක් සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාදක ඖෂධ සහ මනෝ වර්තක පිළිබඳ සම්මුතියක් සම්මත කරගනු ලැබ 1990 නොවැම්බර් මස 23 වන දින මාලේ නගරයේ දී අත්සන් කරනු ලැබූ හෙයින් ද :

ඉහත සඳහන් සම්මුතිවල පාර්ශ්වකරුවකු වන්නා වූ ශ්‍රී ලංකාව ද එකී සම්මුතිවල විධිවිධාන ශ්‍රී ලංකාවෙහි බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන ඇති කිරීමට බැඳී සිටින හෙයින් සහ මාදක ඖෂධ හා මනෝ වර්තක නිති විරෝධීව ජාවාරම් කිරීමෙහි ජාත්‍යන්තර දෘෂ්ටිය ප්‍රකාර ක්‍රියා කිරීමට සහ 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ I වන වගුවේ සහ II වන වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීමට ශ්‍රී ලංකාවට හැකිවනු පිණිස එවැනි විධිවිධාන අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. (1) මේ පනත 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නිති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

(2) (1) වන උප වගන්තිය, මේ පනත පාර්ලිමේන්තු පනතක් ලෙස සහතික කරනු ලබන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු අතර, පනතේ සෙසු විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන

2-PL 002503— 3,475 (2007/10)

නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ විවිධ කොටස් සම්බන්ධයෙන් විවිධ දිනයන් නියම කරනු ලැබිය හැකි ය ; එසේ වුව ද—

(අ) II වන කොටස සම්බන්ධයෙන් නියම කරනු ලබන දිනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මාදක ඖෂධ සහ මනෝ වර්තක නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීමට එරෙහිව වූ 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනයට වඩා කලින් දිනයක් නොවිය යුතු ය;

(ආ) III වන කොටස සම්බන්ධයෙන් නියම කරනු ලබන දිනය මාදක ඖෂධ සහ මනෝ වර්තක පිළිබඳ කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංගමයේ සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනයට වඩා කලින් එළඹෙන දිනයක් නොවිය යුතු ය.

## I වන කොටස

## සම්මුතිය ප්‍රකාර වැරදි

වැරදි.

2. (1) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී චේතනාන්විතව—

(අ) යම් මාදක ඖෂධ සහ මනෝ වර්තකයක් නිෂ්පාදනය කරන, තනන, නිස්සාරණය කරන, සකස් කරන, ඉදිරිපත් කරන, විකිණීම සඳහා ඉදිරිපත් කරන, බෙදාහරින, විකුණන, ගෙනැවිත් භාරදෙන, සැපයීම සඳහා තැරැව්කරුවකු ලෙස ක්‍රියා කරන, නිකුත් කරන, මාර්ගස්ථව නිකුත් කරන, ප්‍රවාහනය කරන, ආනයනය කරන හෝ අපනයනය කරන යම් තැනැත්තෙක් ;

(ආ) යම් මාදක ඖෂධයක් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා අබිං, පොපි, කොකා පඳුරු හෝ කංසා (කැනබිස්) ශාඛය වගා කරන යම් තැනැත්තෙක් ;

(ඇ) (අ) ඡේදයේ විස්තර කර තිබෙන යම් කාර්යයක් සඳහා යම් මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් සන්තකයේ තබා ගන්නා හෝ මිලදී ගන්නා යම් තැනැත්තෙක් ;

(ඇ) මේ පනතේ පළමු වන උපලේඛනයේ I වන වගුවෙහි හෝ II වන වගුවෙහි දක්වා ඇති යම් උපකරණයක්, ද්‍රව්‍යයක් හෝ යම් දෙයක්, යම් මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් නීති විරෝධී ලෙස වගා කිරීම, සෑදීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන බවට දැන දැනම එම උපකරණය, ද්‍රව්‍යය හෝ දෙය ප්‍රසම්පාදනය කරන, නිෂ්පාදනය කරන, ගබඩා කරන, ප්‍රවාහනය කරන, විකුණන, බෙදාහරින හෝ භාරදෙන ;

(ඉ) (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල විස්තර කර තිබෙන යම් ක්‍රියාවක් සංවිධානය කරන, පිළියෙල කරන හෝ ඒ ක්‍රියාවක් සඳහා මුදල් සපයන යම් තැනැත්තෙක් ;

(ඊ) යම් දේපළක් අත්කර ගන්නා අවස්ථාවේ දී, ඒ දේපළ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදවල විස්තර කර තිබෙන යම් ක්‍රියාවකින් උපදින ලද හෝ ඒ යම් ක්‍රියාවකට සහභාගිවීමෙන් උපදින ලද දේපළක් බව දැන දැනම ඒ දේපළක් අත්කර ගන්නා, සන්තකයේ තබා ගන්නා හෝ ප්‍රයෝජනයට ගන්නා යම් තැනැත්තෙක් ;

(උ) මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ හෝ II වන වගුවේ දැක්වෙන යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක් හෝ යම් දෙයක් යම් මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් නීති විරෝධීව වගා කිරීමට නිෂ්පාදනය කිරීම හෝ තැනීම පිණිස යොදා ගන්නා බව හෝ යොදා ගැනීමට යන බව දැන දැනම, ඒ උපකරණයක් හෝ ද්‍රව්‍යයක් හෝ යම් දෙයක් තම සන්තකයේ තබා ගන්නා යම් තැනැත්තෙක් ;

(ඌ) මේ වගන්තියේ විස්තර කර තිබෙන යම් වරදක් කිරීමට හෝ නීති විරෝධීව මාදක ඖෂධ හෝ මනෝ වර්තක භාවිත කිරීමට කවර හෝ උපක්‍රමයකින් ප්‍රසිද්ධියේ තැනැත්තන් කැමති කරවා ගන්නා හෝ පොළඹවන යම් තැනැත්තෙක් ;

(එ) මේ වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) යන ඡේදවල විස්තර කර තිබෙන යම් ක්‍රියාවකින් හෝ ක්‍රියාවලින් උත්පාදනය කර ගන්නා ලද හෝ ඒ යම් ක්‍රියාවකට සහභාගි වීමේ ක්‍රියාවකින් උත්පාදනය කර ගන්නා ලද බව දැන

දැනම, ඒ දේපළෙහි නීති විරෝධී ප්‍රභවය වසන් කිරීමේ හෝ සැඟවීමේ කාර්යය සඳහා හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ ක්‍රියා සිදු කිරීමට සම්බන්ධ වූ යම් තැනැත්තකුට ඒ ක්‍රියාවල නෛතික ප්‍රතිවිපාක මග හැරීමට සහාය වීමේ කාර්යය සඳහා එම දේපළ අපවර්තනය කරන හෝ එම දේපළ අන්සතු කරන යම් තැනැත්තෙක් ;

(ඒ) දේපළක් මේ වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදවල විස්තර·කර තිබෙන යම් ක්‍රියාවකින් උත්පාදනය කරගන්නා ලද බව හෝ ඒ ක්‍රියාවකට සහභාගිවීමෙන් උත්පාදනය කරගන්නා ලද බව දැන දැනම, ඒ දේපළෙහි සත්‍ය ස්වභාවය, ප්‍රභවය, පිහිටීම, ඒ දේපළ නියාදනය කිරීම, සංචලනය, ඊට අදාළ අයිතිවාසිකම හෝ ඒ දේපළෙහි අයිතිය වසන් කරන හෝ සඟවන යම් තැනැත්තෙක්,

ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුව ද නොවුව ද මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත වරදකරු කරනු ලැබීමෙන් පසුව අවුරුදු දහයකට නොඅඩු හා අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද,(අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ (ඒ) ඡේදවල සඳහන් කර ඇති ක්‍රියා ශ්‍රී ලංකාව තුළ දී කරනු ලැබ තිබිය යුතු ය. එසේම තව දුරටත්, ඉහත කී විධිවිධාන (218 වන අධිකාරය වූ) විෂ අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනතේ තුන්වන උපලේඛනයේ III වන කොටස අදාළ වන වැරදි සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ යම් වරදක් සිදුකිරීම—

(අ) උත්සාහ කරන ; හෝ

(ආ) අනුබල දෙන ; හෝ

(ඇ) වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත වරදකරු කරනු ලැබූ පසුව ඔහු වරදකරු කරන ලද්දේ යම් වරදක් සිදු කිරීමට උත්සාහ කිරීම හෝ අනුබල දීම හෝ වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කිරීම සම්බන්ධව ද ඒ වරද ඔහු විසින් සිදු කරන ලද නම් ඔහු යටත් විය හැකිව තිබුණු දඬුවමට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(3) මේ වගන්තියෙහි "අනුබලදීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවලින් ඊට දී තිබෙන අර්ථය ම ඇති අතර "කුමන්ත්‍රණය කිරීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වගන්තියෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(4) මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට දඬුවම් නියම කිරීමේ දී, මෙහි පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධිකරණය සැලකිලිමත් විය යුතු ය :—

(අ) වරදකරු අයත් වන සංවිධානාත්මක අපරාධකාර කණ්ඩායමක් විසින් එම වරද සිදු කිරීමේ දී ඊට සම්බන්ධ වීම ;

(ආ) වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානාත්මක සාපරාධී ක්‍රියාකාරකම්වලට වරදකරුගේ සම්බන්ධතාව ;

(ඇ) අදාළ වරද සිදු කිරීම මගින් පහසුකම් ලද වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම්වලට වරදකරුගේ සම්බන්ධතාව ;

(ඈ) වරද සිදුකිරීමේ දී වරදකරු විසින් සාහසිකත්වය හෝ අවිආයුධ ප්‍රයෝජනයට ගැනීම ;

(ඉ) වරදකරු රජයේ තනතුරක් දැරීම සහ එම තනතුරට වරදෙහි ඇති සම්බන්ධතාව ;

(ඊ) වරද සිදුකිරීමේ දී බාලවයස්කරුවන් පීඩනවලට යටත් කිරීම හෝ යොදා ගැනීම ;

(උ) බන්ධනාගාරයක දී හෝ අධ්‍යාපන ආයතනයක දී හෝ සමාජ සේවා ආයතනයක දී හෝ ඒ කිසිවක් ආසන්නයේ දී නැතහොත් අධ්‍යාපනික, ක්‍රීඩා සහ සමාජ ක්‍රියාකරකම් සඳහා පාසල් ළමුන් සහ ශිෂ්‍යයන් එක්රැස්වන වෙනත් යම් ස්ථානයක දී වරද සිදු කර තිබීම.

මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීමේ අධිකරණ බලය මහාධිකරණය සතු බව.

**3.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබ කොළඹ දී පවත්වනු ලබන්නා වූ පළාත්බද මහාධිකරණයට මේ පනත, යටතේ වූ වැරදි ලිඛිත නීතිය මගින් විධිවිධාන සලසා ඇති ආකාරයට විභාග කොට තීරණය කිරීමට අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලබන අවස්ථාවක—

(අ) එම ක්‍රියාව සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාවේ සිටී නම් ;

(ආ) එම ක්‍රියාව සිදු කරනු ලැබුවේ, ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් නම් හෝ මෙම සම්මුතියට පාර්ශ්වකරුවකු වන වෙනත් රාජ්‍යයක ජාතිකයකු විසින් නම් හෝ තමාගේ සාමාන්‍ය පදිංචිය ශ්‍රී ලංකාවේ ඇති ආදේශික තැනැත්තකු විසින් නම් ;

(ඇ) වරද සිදු කරන අවස්ථාවේ දී, එම ක්‍රියාව සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි යම් නෞකාවකට හෝ ගුවන් යානයකට එරෙහිව නම් හෝ නෞකාවක් හෝ ගුවන් යානයක් ඇතුළත දී නම් ;

(ඈ) වරද සිදු කරන අවස්ථාවේ දී, එම ක්‍රියාව සිදු කරන ලද්දේ මේ සම්මුතියට පාර්ශ්වකරුවකු වන වෙනත් රාජ්‍යයක නීති යටතේ ලියාපදිංචි කරන ලද නෞකාවකට හෝ ගුවන් යානයකට එරෙහිව නම් නැතහොත් එවැනි නෞකාවක් හෝ ගුවන් යානයක් ඇතුළත දී නම් ;

(ඉ) එම වරද සිදු කරනු ලැබ ඇති බවට චෝදනා කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් ;

(ඊ) එම ක්‍රියාව සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට යම් ක්‍රියාවක් සිදු කරන ලෙස හෝ සිදු කිරීමෙන් වැළකී සිටින ලෙස බලකිරීම සඳහා නම්,

එම වරද ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලැබූ ලෙස සලකා එම වරද පිළිබඳව විභාග කිරීමට (1) වන උපවගන්තියේ සඳහන් මහාධිකරණයට අධිකරණ බලය ඇත්තේ ය.

මේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

4. මේ පනත යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාට—

(අ) ඔහු ජාතිකත්වය දරන රජයෙහි ආසන්නතම උචිත නියෝජිතයා හෝ ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරව හිමිකම තිබෙන රජයෙහි ආසන්නතම උචිත නියෝජිතයා හෝ ඔහු අදේශික තැනැත්තකු නම්, ඔහු ඉල්ලා සිටින්නා වූ සහ

ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කැමැත්තෙන් සිටින්නා වූ රජයක ආසන්නතම උචිත නියෝජිතයා හෝ අප්‍රමාදව ඇමතීමට හිමිකම තිබිය යුතු ය; තව ද

(ආ) එකී රජයේ නියෝජිතයාට ඒ තැනැත්තා හමුවීමට පැමිණීමට හිමිකම තිබිය යුතු ය.

5. 2 වන වගන්තිය යටතේ නඩු පැවරීමක දී යම් ඖෂධයක් හෝ ද්‍රව්‍යයක් මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් ද නැතහොත් 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ හෝ සාක් සම්මුතියේ I වගුවේ හෝ II වන වගුවේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍යක් ද යන ප්‍රශ්නය උද්ගත වූ අවස්ථාවක, ඒ ඖෂධය හෝ ද්‍රව්‍ය මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් නැතහොත් 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ හෝ සාක්සම්මුතියේ I වන වගුවේ හෝ II වගුවේ නිශ්චිතව සඳහන් ද්‍රවයක් බවට රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවක් සාක්ෂියේ දී ආවේශ්‍ය කරගත හැකි විය යුතු අතර එය එහි සඳහන් කරුණු පිළිබඳ මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. සාක්ෂි.

මේ වගන්තියේ කාර්යය සඳහා රජයේ "රස පරීක්ෂකවරයා" යන්නට රජයේ අතිරේක රස පරීක්ෂක වරයකු, නියෝජ්‍ය රසපරීක්ෂක වරයකු, රජයේ ජ්‍යෙෂ්ඨ රස පරීක්ෂකවරයකු හෝ රජයේ සහකාර රස පරීක්ෂක වරයකු ඇතුළත් වේ.

6. (1) මේ පනත යටතේ වරදක් සඳහා යම් තැනැත්තකුට මහාධිකරණයේ දී අධිචෝදනා කිරීමේ දී— තහනමට ගැනීම සහ මුදල් තහනම් කිරීම.

(අ) වරද සිදුකරනු ලැබුවේ නැතහොත් වරද සිදු කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරනු ලැබුවේ යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ද එම භාණ්ඩය හෝ ද්‍රව්‍යය;

(ආ) එම වරද සිදු කිරීම මගින් ලැබෙන මුදල්,

එම අධිචෝදනා පත්‍රය ගොනු කිරීමේ දින සිට බලපවත්වන පරිදි තත් කාර්ය සඳහා මහාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත තහනමට ගැනීමට හෝ එම මුදල් තහනම් කිරීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් තහනමට ගැනීම හෝ එම භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන මුදල් තහනම් කිරීම නඩු විභාගය අවසන් වනතුරු බලාත්මකව පැවතිය යුතු ය.

7. (1) 2 වන වගන්තිය යටතේ ගැනෙන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට— රජය සතු කිරීම.

(අ) ඒ වරද සිදු කරන ලද්දේ යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් පිළිබඳව ද නැතහොත් ඒ වරද සිදු කිරීම සඳහා හෝ ඒ හා සම්බන්ධව

යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් ප්‍රයෝජනයට ගෙන තිබේ ද ඒ ද්‍රව්‍ය හෝ දෙය;

(ආ) ඒ වරද කිරීමෙන් ලැබූ මුදල්,

රජය සතු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් රජය සතු කරන ලද යම් දේපළක් සම්පූර්ණයෙන් රජය සතු විය යුතු ය. එම රජය සතු කිරීම—

(අ) රජය සතු කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කර නොමැති අවස්ථාවක එවැනි රජය සතු කිරීමේ ආඥාවකට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි කාලසීමාව ඉකුත් වූ විට ;

(ආ) ඒ රජය සතු කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කර ඇත්තා වූ සහ රජය සතු කිරීමේ එම ආඥාව අභියාචනාධිකරණය විසින් තහවුරු කර ඇත්තා වූ ද, අභියාචනාධිකරණයේ ඒ ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි කාලසීමාව ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කර නොමැත්තා වූ අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කළ හැකි කාලසීමාව ඉකුත් වූ විට ; හෝ

(ඇ) රජය සතු කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ සහ ඒ අභියාචනය පිළිබඳව අභියාචනාධිකරණයේ තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක එම රජය සතු කිරීමේ ආඥාව තහවුරු කරන හෝ අනුමත කරන තීරණයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලැබූ විට,

එම රජය සතු කිරීම බලාත්මක වන්නේ ය.

(3) යම් බැංකුවක යම් ගිණුමක බැරට තිබෙන යම් අරමුදල් දෙවන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීමෙන් ලැබුණු මුදල් බවට ඒ වරද පිළිබඳ නඩු විභාගයේ දී ඉදිරිපත් වූ සාක්ෂි මත අධිකරණයක් සෑහීමට පත් වූ අවස්ථාවක ඒ වරද පිළිබඳ නඩු විභාගය අවසාන වන

නෙක් ඒ ගිණුමෙන් මුදල් ආපසු ලබා ගැනීමට අවසර දීම හෝ ඉඩ දීම එම අධිකරණයේ ලිඛිත ආඥාවක් මගින් ඒ බැංකුවේ කළමනාකරුට තහනම් කරනු ලැබිය හැකි ය.

8. 2 වන වගන්තිය යටතට ගැනෙන වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව, සංඥෙය හා ඇප දිය නොහැකි වරදක් වන්නේ ය. වැරදි සංඥෙය බව හා ඇප දිය නොහැකි වැරදි බව.

## II වන කොටස

## මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධීව ගණුදෙනු කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතිය

## I වන පරිච්ඡේදය

## මාදක ඖෂධ සහ මනෝ වර්තක

9. මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධීව ගණුදෙනු කිරීමට එරෙහි (මෙහි මින් මතු "එක්සත් ජාතීන්ගේ සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පාර්ශ්වකරුවන් වන රටවල් කවරේද යන වග, අමාත්‍යවරයා විසින් මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ කලින් කළ පළ කරනු ලබන නියමයක් මගින් සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ යම් රටක් සම්බන්ධයෙන් කරනු ලැබූ නියමයක් බලාත්මකව පවතින්නේ ද ඒ රටක් මේ පනතේ මේ කොටස යටතේ මෙහි මින් ඉදිරියට "සම්මුතිගත රටක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ. සම්මුතියේ පාර්ශ්ව.

10. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත, එහි උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුවම මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම.

"(52) 2008 අංක 01 දරණ මාදක ඖෂධ හා මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ එනම් (1988 දෙසැම්බර් 20 වන දින වියනාහි දී අත්සන් තබන ලද මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධීව ගණුදෙනු කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ) විෂය පථයට ඇතුළත් වරදක්."

උර්පණ පනතට අදාළ අර්ථ නිරූපණය.

**11.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ පනතේ "ආ" උපලේඛනයේ සහ මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන යම් වරදක්, ඒ යම් වරදක් සම්බන්ධයෙන් චෝදිත හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ඒ පනත යටතේ උදර්පණය කිරීමේ කාර්යය සඳහා ම පමණක්, ශ්‍රී ලංකාව සහ සම්මුතිගත රටක් අතර බලපවත්වන පරිදි පිස්කල් වරදක් හෝ දේශපාලනීය ස්වභාවයේ වරදක් හා සම්බන්ධ වරදක් හෝ දේශපාලන අරමුණු මගින් පොළඹවන ලද වරදක් නොවන්නාක් සේ සැලකිය යුතු ය.

මේ පනතේ දෙවන උපලේඛනයේ වැරදි සම්බන්ධව උදර්පණය සඳහා උදර්පණ ක්‍රියාමාර්ග මගින් විධිවිධාන සැලසෙන සේ සැලකිය යුතු බව.

**12.** ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සම්මුතිගත රටක් අතර උදර්පණ වැඩපිළිවෙලක් බලාත්මකව පවතින අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වැරදි සම්බන්ධයෙන් උදර්පණය කිරීම පිණිස විධිවිධාන එහි ඇතුළත්ව තිබෙන ලෙස සැලකිය යුතු ය.

එක්සත් ජාතීන්ගේ සම්මුතිය, මේ පනතේ දෙවන උපලේඛනයේ වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ සම්මුතිගත රටක් අතර උදර්පණ වැඩපිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සැලකිය හැකි බව.

**13.** ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සම්මුතිගත රටක් අතර උදර්පණ වැඩපිළිවෙලක් බලාත්මකව නොපවතින අවස්ථාවක, 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඒ සම්මුතිගත රට අතර ඇතිකර ගන්නා ලද, මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වැරදි සම්බන්ධව ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා උදර්පණය සඳහා විධිවිධාන සලසන වැඩපිළිවෙලක් ලෙස, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි ය.

යම් තැනැත්තකු උදර්පණය කරන ලෙස ඉල්ලීමක් ලැබුණු විට ඒ තැනැත්තාට එරෙහිව ගෙන තිබෙන ක්‍රියාමාර්ග ඉල්ලීම කරන රටට දැනුම්දීම අමාත්‍යවරයාගේ කාර්යය බව.

**14.** මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වරදක් සම්බන්ධයෙන් චෝදිත හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු උදර්පණය කරන ලෙස සම්මුතිගත රටක් විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරන ලද අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම හෝ ඔහු උදර්පණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව ගෙන තිබෙන හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග, ඉල්ලීම කරන රටේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකාව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් අප්‍රමාදව දැනුම් දිය යුතු ය.

සම්මුතිගත රටවලට සහාය දීම යනාදිය.

15. (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ කාර්ය සඳහා අවශ්‍යවන කවර අවස්ථාවක වුව ද 2002 අංක 25 දරන, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව නියම කරන, පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජික රටවල් සහ ශ්‍රී ලංකාව අතර හෝ ඒ පනතට අනුකූලව ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත්ව සිටින, පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් නොවන රටවල් අතර හෝ සහයෝගිතාව සැපයීම සම්බන්ධයෙන්, ඉහත සඳහන් පනතේ විධිවිධාන අදාළ කරගත හැකි විය යුතු ය.

(2) ඉහත සඳහන් පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව නියම කරන ලද රටක් හෝ එම පනතට අනුකූලව ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත්ව තිබෙන පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් හෝ නොවන රටක් සම්බන්ධයෙන් වන විට, 2 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධව විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා (සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගැනීම, අධිකරණ නියෝග භාරදීම සහ සෝදිසි කිරීම් පැවැත්වීම ඇතුළුව) එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ස්වකීය බැඳීම් ඉටු කිරීම සඳහා සැපයිය යුතු තාක් දුරට සියලු සහාය සැපයීම, ආණ්ඩුවේ කාර්යය විය යුතු අතර, අමාත්‍යවරයා මගින් සම්මුතිගත රටකින් අවශ්‍ය විය හැකි සියලු සහාය ඉල්ලා සිටිය හැකි ය.

(3) සම්මුතිගත රටකට සහාය ලබා දීම, සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

II වන කොටසේ I වන පරිච්ඡේදය සඳහා අර්ථ නිරූපණය.

16. මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා—

"මාදක ඖෂධ" යන්නෙන්, 1961 මාදක ඖෂධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ I, II සහ IV වන උපලේඛනවල ඇතුළත් කර ඇත්තා වූ ද මේ පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන්නා වූ ද යම් මාදක ඖෂධයක් අදහස් වේ;

"මනෝ වර්තක" යන්නෙන්, 1971 මනෝ වර්තක පිළිබඳ සම්මුතියේ I, II, III සහ IV වන උපලේඛනවල ඇතුළත් කර ඇත්තා වූ ද මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද ස්වභාවික හෝ කෘත්‍රිම යම් ද්‍රව්‍යයක් හෝ යම් ස්වභාවික ද්‍රව්‍යයක් ඇතුළත් වේ.

## II වන පරිච්ඡේදය

## පුරෝගාමී පාලන අධිකාරිය පිහිටුවීම සහ මාදක ඖෂධ හෝ මනෝ වර්තක නිති විරෝධි ලෙස නිෂ්පාදනය කිරීමේ දී භාවිත කරනු ලබන්නා වූ ද, I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන්නා වූ ද ද්‍රව්‍ය පාලනය

සම්මුතිගත රාජ්‍යය.

17. මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා "සම්මුතිගත රාජ්‍ය" යනු 9 වන වගන්තියේ කාර්යය සඳහා සහතික කරන ලද යම් රාජ්‍යයක් විය යුතු ය.

පුරෝගාමී පාලන අධිකාරිය මේ කොටස් පරිපාලනය සඳහා වගකිව යුතු බව.

18. මේ පනතේ මේ කොටසේ විධිවිධාන පරිපාලනය කිරීමේ වගකීම භාරව සිටිය යුතු තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරෝගාමී පාලන අධිකාරිය වශයෙන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු ය. 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි විධිවිධාන මගින් නියම කර ඇති පරිදි ඉහත කී ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සඳහා අවශ්‍ය පියවර මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කර ඇති ආකාරයට මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්යය.

19. (අ) මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් අදාළ කර්මාන්තවල අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන නියම කරනු ලබන ආකාරයට වලංගු බලපත්‍රයක් ප්‍රකාරව එසේ සිදු කරන බවට ;

(ආ) පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අදාළ කටයුතු බලපත්‍රලාභියා විසින් කටයුතු කරන්නේ යම් පරිශ්‍රයක සිට ද, එම පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගන්නා බවට ;

(ඇ) මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය, ඒවා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද කාර්ය සඳහා පමණක් භාවිත කරන බවට ;

(ඇ) පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය භාවිත කරමින් යම් මාදක ඖෂධයක් හෝ මනෝ වර්තකයක් නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම යථා පරිදි වාර්තා කරන බවටත්, එම වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගන්නා බවටත් ;

(ඉ) පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යයක් ආනයනය කරන හෝ අපනයනය කරන සෑම තැනැත්තෙක් ම, එම ද්‍රව්‍යය ආනයනය කිරීම, අපනයනය කිරීම, භාවිත කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම පෙන්නුම් කරන ත්‍රෛමාසික වාර වාර්තා අධිකාරිය වෙත ඉදිරිපත් කරන බවට ;

(ඊ) මෙ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යයකට අදාළව සියලු සැක කටයුතු ගණුදෙනු පිළිබඳ විස්තර, එම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සම්බන්ධ තැනැත්තන් විසින් ප්‍රමාදයකින් තොරව අධිකාරිය වෙත දැනුම් දෙන බවට;

(උ) නියම කර ඇති කාරණා පිළිබඳ නිසි වාර්තා පවත්වාගෙන යන බවටත්, එම කටයුතු සහ වාර්තා නියම කරනු ලබන ආකාරයට තියාමනය කරන බවටත්,

අධිකාරිය සහතික විය යුතු ය.

20. (1) තත් කාර්ය සඳහා නියමිත ආකාරයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී 1969 අංක 1 දරන ආනයන සහ අපනයන පනත ප්‍රකාරව තත් කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මිස, මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන යම් ද්‍රව්‍යයක් කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම නොකළ යුතු ය.

I වන වගුවේ සහ II වන වගුවේ සඳහන් සියලු ද්‍රව්‍ය ආනයනය කළ යුත්තේ හෝ අපනයනය කළයුත්තේ බලපත්‍රයක් මත බව.

(2) මේ පනතේ පළමු වන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලීමක් ලැබීමේ දී, එම ඉල්ලීම කරනු ලබන්නේ යම් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් ද එම ද්‍රව්‍යය සහ

එහි ප්‍රමාණ අදාළ කර්මාන්තයේ නියමයන්ට අනුකූල වන බවට නිර්දේශයක් ලබා ගැනීම සඳහා ආනයන සහ අපනයන පාලකවරයා විසින් එම ඉල්ලීම අධිකාරිය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) යම් ඉල්ලීමක් අධිකාරිය වෙත යොමුකර දින දහයක් ඇතුළත අධිකාරිය විසින් එහි නිර්දේශය ඉදිරිපත් කළ යුතු ය. සෑම ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන ත්‍රෛමාසික වාර්තාවල පදනම මත සත්‍යායනය කර, එම නිර්දේශය අදාළ කර්මාන්තයේ සත්‍ය අවශ්‍යතා මත පදනම් විය යුතු ය.

(4) ඉන්පසු හේතු සඳහන් කර ඉල්ලීම සහ නිර්දේශය අදාළ වන බලපත්‍රය ආනයන සහ අපනයන පාලකවරයා විසින් ප්‍රදානය කළ යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහාධිකරණය ඉදිරිපිට අධිචෝදනා පත්‍ර මත පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරුවීමේ දී අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

වාර්තා පරීක්ෂා කිරීම.

21. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීම හෝ අපනයනය කිරීම, භාවිත කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීමට අදාළ කටයුතු බලපත්‍රලාභියා විසින් සිදුකරනු ලබන පරිශ්‍රයට සියලු සාධාරණ වේලාවන්හි දී නියි දැනුම්දීමකින් පසුව ඇතුළු වී එය පරීක්ෂා කිරීමටත්, එම කරුණට අදාළව භාවිත කරනු ලබන යම් උපකරණ හෝ පොත්පත්, ලේඛන හෝ වෙනත් වාර්තා පරීක්ෂා කිරීමටත් අධිකාරියට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සිය කර්තව්‍ය ඉටුකරන අතරතුර අධිකාරියට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා මත පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු, කිරීමේ දී මාස එකකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

පැහැ දුරු කිරීම.

22. පළමුවන උපලේඛනයේ I වන වගුවේ සහ II වන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යය පහසුවෙන් භාවිත කළ නොහැකි පරිදි හෝ

ආපසු ලබාගත නොහැකි පරිදි සංයෝග කරනු ලබන සහ ලැබෙන ප්‍රතිඵලයෙන් මහජන සෞඛ්‍යයට අවදානමක් සිදු නොවන ඖෂධීය පිළියෙල කිරීම්වලට සහ වෙනත් සංයෝගවලට මේ පනතේ විධිවිධාන අදාළ නොවන බව සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙහි ලා සඳහන් කරනු ලැබේ.

## III වන කොටස

## කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානු සංගමයේ, මාදක ඖෂධ සහ මනෝ වර්තක පිළිබඳ සම්මුතිය

23. මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන යම් රටක් සමග ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇතිකරගෙන තිබෙන්නා වූ ද මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද උද්ධරණ වැඩපිළිවෙලක් පවත්නා අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්ය සඳහා එම වැඩපිළිවෙලට, මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වැරදි සම්බන්ධයෙන් උද්ධරණය සඳහා විධිවිධාන ඇතුළත්ව තිබෙන ලෙස සැලකිය යුතු ය.

ඇතැම් සාක් රටවල් සමග පවත්නා උද්ධරණ වැඩපිළිවෙල මගින් දෙවන උපලේඛනයේ දැක්වෙන වැරදි සඳහා විධිවිධාන සැලසෙන ලෙස සැලකිය යුතු බව.

24. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනත, එහි උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුවම මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(53) 2008 අංක 01 දරන මාධක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ (එනම් 1990 නොවැම්බර් මස 23 වන දින මාලේ හි දී අත්සන් තබන ලද මාදක ඖෂධ සහ මනෝ වර්තක පිළිබඳව කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානු සංගමයේ සම්මුතියේ) විෂය පථයට ඇතුළත් වරදක්.".

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනත සංශෝධනය කිරීම.

25. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනය වන විට, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් රටක් අතර ඇති කර ගන්නා ලද උද්ධරණ වැඩපිළිවෙලක් බලාත්මකව නොමැති විට, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් සම්මුතිය, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එකී රට විසින් මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වැරදි හා සම්බන්ධව උද්ධරණය කිරීම සඳහා විධිවිධාන සලසන උද්ධරණ වැඩපිළිවෙලක් ලෙස ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය හැකි ය.

සම්මුතිය, මෙහි උපලේඛනයේ දැක්වෙන වැරදි පිළිබඳව ශ්‍රී ලංකාව සහ සාක් සංවිධාන රටක් අතර උද්ධරණ වැඩ පිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි බව.

අර්ථ නිරූපණය.

**26.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කවර විධිවිධානයක් තිබුණ ද, ඒ පනතේ "ආ" උපලේඛනයේ (ඊ) සහ (උ) ඡේදවල සහ මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන යම් වරදක්, ඒ යම් වරදක් සම්බන්ධයෙන් චෝදිත හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ඒ පනත යටතේ උදර්පණය කිරීමේ කාර්යය සඳහාම පමණක් ශ්‍රී ලංකාව සහ මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රටක් අතර බලපවත්වන පරිදි පිස්කල් වරදක් හෝ දේශපාලනය ස්වභාවයේ වරදක් හෝ දේශපාලනීය වරදක් හා සම්බන්ධ වරදක් හෝ දේශපාලන අරමුණු මඟින් පොළඹවන ලද වරදක් නොවන්නාක් සේ සැලකිය යුතු ය.

යම් තැනැත්තකු උදර්පණය කරන ලෙස ඉල්ලීමක් ලැබුන විට, ඒ තැනැත්තාට එරෙහිව ගෙන තිබෙන ක්‍රියා මාර්ග ඉල්ලීම කරන රටට දැනුම්දීම අමාත්‍යවරයාගේ කාර්යය බව.

**27.** (1) මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර තිබෙන වරදක් සම්බන්ධයෙන් චෝදිත හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු උදර්පණය කරන ලෙස මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන යම් රටක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම හෝ උදර්පණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන තිබෙන හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග ඉල්ලීම කරන රටේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් අප්‍රමාදව දැනුම් දිය යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් චෝදිත හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත යටතේ උදර්පණය කරන ලෙස මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රටක ආණ්ඩුවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර ඒ තැනැත්තා ඒ පනත යටතේ උදර්පණය නොකළ යුතු බවට තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාට චෝදිත වරද සම්බන්ධව නඩු පැවරීම හෝ වෙනත් උචිත ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා එම කාරණය අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සාර්ක් රටවලට සහායදීම යනාදිය.

**28.** (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන කවර අවස්ථාවක වුව ද 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඉහත සඳහන් පනතට අනුකූලව, ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත්ව සිටින මේ පනතේ 5 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රටක් අතර අන්‍යොන්‍ය සහාය සැපයීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වී නොමැති මේ පනතේ 5 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රටක් සම්බන්ධයෙන් වන විට 2 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධව විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සහාය (සාක්ෂි සහ ප්‍රකාශ ලබාගැනීම, අධිකරණ නියෝග බාරදීම සහ සෝදිසි කිරීම පැවැත්වීම ඇතුළුව) සම්මුතිය යටතේ ඒවාසිය බැඳීම් ඉටු කිරීම සඳහා සැපයිය යුතුතාක් දුරට සියලු සහාය සැපයීම ආණ්ඩුවේ කාර්යය විය යුතු අතර, අමාත්‍යවරයා මගින් මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් රටක අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය විය හැකි සියලු සහාය ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) සම්මුතිගත රටකට සහාය ලබාදීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස
## විවිධ

29. මේ පනතේ 3, 4, 5, 6, 7 සහ 8 වගන්තිවල විධිවිධාන මේ පනතේ II වන සහ III වන කොටස්වල විධිවිධානවලට අදාළ විය යුතු ය.

3, 4, 5, 6, 7 සහ 8 වන වගන්තිවල විධිවිධාන II වන සහ III වන කොටස්වලට අදාළ විය යුතු බව.

30. (1) 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ I වන වගුවට සහ II වන වගුවට සිදු කරන ලද වෙනස්වීම් බලාත්මක කිරීම සඳහා පළමුවන උපලේඛනයේ I වන වගුවට හෝ II වන වගුවට යම් ද්‍රව්‍ය එකතු කිරීමෙන්, එම වගුවලින් යම් ඖෂධයක් ඉවත් කිරීමෙන් හෝ යම් ද්‍රව්‍යයක් එක් වගුවක සිට තවත් වගුවකට මාරු කිරීමෙන් මේ පනතේ පළමුවන උපලේඛනය පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

පළමුවන උපලේඛනයට කරනු ලබන සංශෝධන.

(2) පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුව විසින් උපලේඛනය සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා සම්මතය අනුමත කිරීමේ දී උපලේඛනයට කරන ලද සංශෝධනයේ සඳහන් කර ඇති ආකාරයට යෝජනා සම්මතයේ අන්තර්ගත කරුණු සඳහන් කරමින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකළ යුතු ය.

නියෝග.

**31.** (1) මේ පනත යටතේ බලය පවරන ලද හෝ සෑදීමට නියමිත යම් කරුණක් සඳහා හෝ මේ පනතේ විධිවිධාන සහ ප්‍රතිපත්ති ඉටු කිරීම හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් අමාත්‍යවරයා වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) 19 වන සහ 20 වන වගන්ති යටතේ බලපත්‍ර සඳහා වූ ඉල්ලීම් සහ පරිශ්‍ර ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ආකාරය, එම කාර්ය සඳහා භාවිත කරනු ලබන ආකෘති පත්‍ර සහ අය කළ යුතු ගාස්තු ;

(ආ) 19 වන සහ 20 වන වගන්ති ප්‍රකාරව ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් පවත්වාගෙන යා යුතු රෙජිස්ටර් සහ වාර්තා සහ පහත සඳහන් කරුණු පිළිබඳ විස්තර:—

(i) ආනයනකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහ හැකි අවස්ථාවන්හි දී භාණ්ඩ එවන තැනැත්තන්ගේ නම් ;

(ii) ආනයනය කරනු ලබන හෝ අපනයනය කරනු ලබන ද්‍රව්‍යයේ නාම සහ ඒවායේ ප්‍රමාණයන් ;

(iii) ද්‍රව්‍ය රැගෙන ආ ස්ථාන හා බෙදා හැරීමේ දිනයන් ;

(iv) ද්‍රව්‍ය ආනයනය කරනු ලබන්නේ යම් කර්මාන්තයක් සඳහා ද, එම කර්මාන්තයට අදාළව ආනයනය කිරීමේ කාර්ය;

(ඇ) 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ I වන වගුවේ සහ II වන වගුවේ ඇතුළත් කර ඇති ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, භාවිත කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම පෙන්නුම් කරමින් 20 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ත්‍රෛමාසික වාර්තාවල ඇතුළත් කළ යුතු කරුණු ;

(ඇ) කටයුතු නියාමනය කිරීමේ ආකාරය සහ පනතේ නිශ්චිතව සඳහන් වන නියාමනය කිරීම සඳහා වගකිව යුතු තැනැත්තන් සහ වාර්තා.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක්ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**33.** මේ පනතෙහි—

"කංසා ශාඛය" යන්නෙන්, කැනාබිස් ජනුවට අයත් යම් ශාඛයක් අදහස් වේ ;

"කොකා පඳුර" යන්නෙන්, එරිත්‍රොක්ෂයිලොන් ජනුවට අයත් විශේෂයක යම් ශාඛයක් අදහස් වේ ;

"මාදක ඖෂධය" යන්නෙන් මේ පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඖෂධයක් අදහස් වේ ;

"අබිං පොපි" යන්නෙන්, "පපාවර් සොම්නිෆෙරුම්" විශේෂයට අයත් ශාඛයක් අදහස් වේ;

"පුරෝගාමී පාලන අධිකාරිය" යන්නෙන්, 18 වන වගන්තියේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අධිකාරිය වශයෙන් පත්කරනු ලබන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"ලැබීම්" යන්නෙන්, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට අනුකූලව තහවුරු කරන ලද යම් වරදක් සිදු කිරීම මගින් ඍජුවම හෝ වක්‍රව ව්‍යුත්පන්න වූ හෝ ලබාගත් යම් දේපළක් අදහස් වේ;

"දේපළ" යන්නෙන්, ද්‍රව්‍යවත් හෝ අද්‍රව්‍යවත් චංචල හෝ නිශ්චල, ස්පර්ශනීය හෝ අස්පර්ශනීය සෑම වර්ගයකම වත්කම් සහ ඒ වත්කම්වල හිමිකම හෝ ඒවාට ඇති ස්වාර්ථ සම්බන්ධතාවට සාක්ෂි දරන ලේඛන හෝ සාධන පත්‍ර අදහස් වේ;

"මනෝ වර්තක" යන්නෙන්, මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් ස්වභාවික හෝ කෘත්‍රිම ද්‍රව්‍යයක් හෝ යම් ස්වභාවික දෙයක් අදහස් වේ.

පළමුවන උපලේඛනය

(2, 18, 19, 20 සහ 28 වගන්ති)

| I වන වගුව | II වන වගුව |
|---|---|
| 1. ඇසිටික් ඇන්හයිඩ්රයිඩ්<br>එච්. එස්. සංකේතය 2915. 24<br>සී. ඒ. එස්. අංකය108-24-7 | 1. ඇසිටෝන්<br>එච්. එස්. සංකේතය 2914.11<br>සී. ඒ. එස්. අංකය 67-64-1 |
| 2. එන්. ඇසිටිලැන්ත්‍රනිලික් අම්ලය<br>එච්. එස්. සංකේතය 2924.23<br>සී. ඒ. එස්. අංක 89-52-1 | 2. ඇන්ත්‍රනිලික් අම්ලය<br>එච්. එස්. සංකේතය 2922 .43<br>සී. ඒ. එස්. අංකය 118-92-3 |
| 3. එපිහිඩ්රින්<br>එච්. එස්. සංකේතය 2939.41<br>සී. ඒ. එස්. අංක 299-42-3 | 3. ඊතයිල් ඊතර්<br>එච්. එස්. සංකේතය 2909.11<br>සී. ඒ. එස්. අංක 60-29-7 |
| 4. අර්ගොමෙට්‍රින්<br>එච්. එස්. අංකය: 2939.61<br>සී. ඒ. එස්. අංකය : 60-79-7 | 4. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය<br>එච්. එස්. අංකය: 2806.10<br>සී. ඒ. එස්. අංකය :7647-01-0 |
